# 20 ලඝුගණක - II

ලඝුගණක පිළිබඳ මින් පෙර ඒකකයේ දී උගත් කරුණු සහ ලඝුගණකවල වෙනත් භාවිතයන් සිහිපත් කර ගැනීමට අභ්‍යාසයක යෙදෙමු.

**20-1 අභ්‍යාසය**

(1) දර්ශක නීති ඇසුරින් සුළු කරන්න.

(i) $10^{0.1819} \times 10^{0.4509}$ (ii) $10^{1.25} \times 10^{0.954}$

(iii) $10^{2.0876} \times 10^{1.3566} \times 10^{0.2199}$ (iv) $10^{0.7608} \div 10^{0.4432}$

(v) $10^{2.6592} \div 10^{1.7209}$ (vi) $\dfrac{10^{1.7566} \times 10^{2.0702}}{10^{0.5341}}$

(2) මෙම ප්‍රකාශ, ලඝුගණක ප්‍රකාශ ලෙස ලියන්න.

(i) $243 = 3^5$ (ii) $2 = 10^{0.3010}$ (iii) $35 = 10^{1.5441}$

(iv) $7.85 = 10^{0.8949}$ (v) $19.42 = 10^{1.2882}$

(3) මෙම සංඛ්‍යා විද්‍යාත්මක අංකනයෙන් දක්වන්න.

(i) 18 (ii) 324 (iii) 23.5 (iv) 6530

(v) 149.2 (vi) 2.77 (vii) 14900 (viii) 10.58

(4) විද්‍යාත්මක අංකනයෙන් ලියා ඇති සංඛ්‍යා සාමාන්‍ය ආකාරයට ලියන්න.

(i) $1.02 \times 10^2$ (ii) $2.4 \times 10^5$

(iii) $5.64 \times 10^1$ (iv) $7.521 \times 10^2$ ( v) $3.95 \times 10^6$

## 20-1 සාමාන්‍ය ලඝුගණක

ගණනය කිරීම්වල දී සංඛ්‍යාවල 10 පාදයට ලඝුගණක භාවිතය බහුල ව සිදුවේ. සංඛ්‍යාවක 10 පාදයට ලඝුගණකය, සාමාන්‍ය ලඝුගණකය ලෙස හැඳින්වෙයි.

### ක්‍රියාකාරකම් (1)

10 බල වශයෙන් ප්‍රකාශ කර ඇති පහත සඳහන් සංඛ්‍යාවල ලඝුගණක අගය සොයමු.

$1 = 10^0$ නිසා $\log_{10}1 = 0$

$10 = 10^1$ නිසා $\log_{10}10 = 1$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

100 $= 10^2$ නිසා $\qquad \log_{10} 100 = 2$

1000 $= 10^3$ නිසා $\qquad \log_{10} 1000 = 3$

**සටහන:- 10 පාදයට ලඝුගණක ලිවීමේ දී පහසුව සඳහා පාදය සටහන් කරනු නො ලැබේ. $log_{10}\mathbf{N} = x$ යන්න $lg\,\mathbf{N} = x$ ලෙස ලියමු.**

ඉහත ආකාරයට පූර්ණ සංඛ්‍යාත්මක දර්ශක සහිත 10 බලවලින් ප්‍රකාශ කළ නොහැකි සංඛ්‍යාවල 10 පාදයට ලඝුගණකය ලබා ගන්නා අයුරු සොයා බලමු.

$lg\,1 = 0$ සහ $\lg 10 = 1$ නිසා 1 ත් 10 ත් අතර අතර සංඛ්‍යාවක ලඝුගණකය 0ත් 1ත් අතර විය යුතුය. ඒ අනුව $lg\,1.2 = x$ නම් $x$ හි අගය ලබා ගැනීමට ලඝුගණක වගුව භාවිත කළ යුතුය.

| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | } සංඛ්‍යාවේ දෙවන දශමස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1.0 | .0000 | .0043 | .0086 | .0128 | .0170 | .0212 | .0253 | .0294 | .0334 | 0374 | |
| 1.1 | .0414 | .0453 | .0492 | .0531 | .0569 | .0607 | .0645 | .0682 | .0719 | .0755 | |
| 1.2 | .0792 | .0828 | .0864 | .0899 | .0934 | .0969 | .1004 | .1038 | .1072 | .1106 | |
| 1.3 | .1139 | .1173 | .1206 | .1239 | .1271 | .1303 | .1335 | .1367 | .1399 | .1430 | |
| 1.4 | .1461 | .1492 | .1523 | .1553 | .1584 | .1614 | .1644 | .1673 | .1703 | .1732 | |
| 1.5 | .1761 | .1790 | .1818 | .1847 | .1875 | .1903 | .1931 | .1959 | .1987 | .2014 | |
| 1.6 | .2041 | .2068 | .2095 | .2122 | .2148 | .2175 | .2201 | .2227 | .2253 | .2279 | |
| 1.7 | .2304 | .2330 | .2355 | .2380 | .2405 | .2430 | .2455 | .2480 | .2504 | .2529 | |
| 1.8 | .2553 | .2577 | .2601 | .2625 | .2648 | .2672 | .2695 | .2718 | .2742 | .2765 | |
| 1.9 | .2788 | .2810 | .2833 | .2856 | .2878 | .2900 | .2923 | .2945 | .2967 | .2989 | |
| 2.0 | .3010 | .3032 | .3054 | .3075 | .3096 | .3118 | .3139 | .3160 | .3181 | .3201 | |

↑ ලඝුගණකය සෙවිය යුතු සංඛ්‍යාවේ මුල් ඉලක්කම් දෙක

↑ ඉලක්කම් තුනක් දක්වා ඇති සංඛ්‍යාවක ලඝුගණකය

- ලඝුගණකය සෙවීමට ඇති සංඛ්‍යාව එක් පූර්ණ සංඛ්‍යාවක් සහ පළමු දශමස්ථානය සහිත ව වගුවේ පළමු තීරයේ දක්වා ඇත.
- සංඛ්‍යාවේ දෙවන දශමස්ථානය වගුවේ ඉහළ පළමු පේළියේ දක්වා ඇත.
- 1.2 ලඝුගණකය සෙවීමේ දී එය 1.20 ලෙස සලකා 1.2 ට අදාළ පේළියේ හා දෙවන දශමස්ථානය වූ 0 වගුවේ ඉහළ පළමු තීරය හමු වන ස්ථානයෙන් අවශ්‍ය ලඝුගණකය ලබාගත හැකි ය.

✳ ඒ අනුව ☐ ලකුණු කර ඇති ස්ථානයෙන් 1.20 හි ලඝුගණකය ලබාගත හැකි ය.

✳ මේ අයුරින්ම 1.57 ලඝුගණකය ලබාගන්නා ආකාරය ද වගුවේ දක්වා ඇත.

$$1.57 = 10^{0.1959}$$
$$lg\,1.57 = 0.1959$$

**20-2 අභ්‍යාසය**

ඉහත ලඝුගණක වගුව ඇසුරින් මෙම සංඛ්‍යාවල ලඝුගණක සොයන්න.

(i) 1.4 (ii) 1.72 (iii) 2 (iv) 2.08 (v) 1.05

## 20-2 ඉලක්කම් 4කින් යුත් සංඛ්‍යාවක ලඝුගණකය

ලඝුගණක වගුවකින් උපුටාගත් කොටසක් පහත දැක්වේ.

| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | මධ්‍යන්‍ය අන්තර තීරුව 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | 2553 | 2577 | 2601 | 2625 | 2648 | 2672 | 2695 | 2718 | 2742 | 2765 | 2 | 5 | 7 | 9 | 12 | 14 | 16 | 19 | 21 |
| 19 | 2788 | 2810 | 2833 | 2856 | 2878 | 2900 | 2923 | 2945 | 2967 | 2989 | 2 | 4 | 7 | 9 | 11 | 13 | 16 | 18 | 20 |
| 20 | 3010 | 3032 | 3054 | 3075 | 3096 | 3118 | 3139 | 3160 | 3181 | 3201 | 2 | 4 | 6 | 8 | 11 | 13 | 15 | 17 | 19 |
| 21 | 3222 | 3243 | 3263 | 3284 | 3304 | 3324 | 3345 | 3365 | 3385 | 3404 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 |

✳ මෙම ලඝුගණක වගුවේ පළමු තීරයේ සංඛ්‍යාවල ඉලක්කම් දෙක අතර දශම තිතත්, ලඝුගණකවල ඉලක්කම් හතරට මුලින් ඇති දශම තිතත් මුද්‍රණය කිරීමේ පහසුව සලකා මුද්‍රණය කර නැත. භාවිතයේ දී එම දශම තිත පවතින බව සැලකිය යුතු ය.

✳ කලින් ලඝුගණක වගුවට වඩා මෙම වගුවේ 1 සිට 9 තෙක් ශීර්ෂ අංක යෙදූ තවත් තීර 9ක් දක්වා ඇත. එම අංකවලින් දැක්වෙන්නේ ලඝුගණකය සෙවිය යුතු සංඛ්‍යාවේ තුන් වන දශමස්ථානයයි. මෙම තීර මධ්‍යන්‍ය අන්තර යනුවෙන් හඳුන්වයි.


✳ ඉලක්කම් 4 ක සංඛ්‍යාවක ලඝුගණක සෙවීමේ දී 4 වන ඉලක්කම සඳහා අගය මෙම මධ්‍යන්‍ය අන්තර තීරයෙන් ලබාගත යුතු අතර හතරවන ඉලක්කම බිංදුව නම් එම තීරය කියවීම අවශ්‍ය නැත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන (1)** 1.932 ලඝුගණකය සොයමු.

19 සඳහන් ව ඇති පේළියත්, 3 ශීර්ෂය වූ තීරයත් හමු වන තැන ඇති සංඛ්‍යාවට එම පේළි යේ ම මධ්‍යන්‍ය අන්තරවල 2 තීරය හමු වන තැන ඇති සංඛ්‍යාව එකතු කිරීමෙන් අදාළ ලඝුගණකය ලැබේ.




පිළිතුර, 2856 + 4 = 2860

✳ මේ අනුව $lg\ 1.932 = 0.2860$ වේ.

**20-3 අභ්‍යාසය**

ඉහත ලඝුගණක වගුව ඇසුරින් මෙම සංඛ්‍යාවල ලඝුගණක සොයන්න.

(i) 1.862 (ii) 2.017 (iii) 1.989 (iv) 2.108 (v) 2.125

## 20-3 10 ට වැඩි සංඛ්‍යාවල ලඝුගණකය සෙවීම

21.12 හි ලඝුගණකය සොයමු.

පළමුව මෙම සංඛ්‍යාව විද්‍යාත්මක අංකනයෙන් දක්වමු.

$21.12 = 2.112 \times 10^1$

2.112 හි ලඝුගණකය = 0.3247 වේ.

එබැවින් $21.12 = 10^1 \times 10^{0.3247}$

$= 10^{1.3247}$

$log_{10} 21.12 = 1.3247$

$lg\ 21.12 = 1.3247$

**නිදසුන (2)** 1854 ලඝුගණකය සොයමු.

$1854 = 1.854 \times 10^3$

$= 10^3 \times 10^{0.2681}$ (1.854 හි ලඝුගණකය 0.2681 නිසා)

$= 10^{3.2681}$

$lg\ 1854 = 3.2681$

සටහන:- ලඝුගණකයක ඇති පූර්ණ සංඛ්‍යාව ''පූර්ණාංශය'' ලෙසත් දශම කොටස ''දශමාංශය'' ලෙසත් හැඳින්වෙයි. $lg\,1834 = 3.2681$

පූර්ණාංශය දශමාංශය

**20-4 අභ්‍යාසය**

ලඝුගණක වගුව ඇසුරින් මෙම සංඛ්‍යාවල දහයේ පාදයට ලඝුගණක ලබාගන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | 78.65 | (ii) | 34.02 | (iii) | 73.12 | (iv) | 91.71 | (v) | 10.43 |
| (vi) | 540.1 | (vii) | 1327 | (viii) | 812.9 | (ix) | 5671 | | |

**වැදගත්**

$\lg 4.763 = 0.6779$
$\lg 47.63 = 1.6779$
$\lg 476.3 = 2.6779$
$\lg 4763 = 3.6779$
$\lg 47630 = 4.6779$

මෙහි ඇති රටාව අනුව ලඝුගණකය සෙවීමට දුන් සංඛ්‍යාවේ පූර්ණ සංඛ්‍යා කොටසේ ඉලක්කම් ගණනට වඩා ලඝුගණකයේ පූර්ණාංශයේ අංකය 1 කින් අඩු බව පෙනේ.

## 20-4 10 පාදයට ලඝුගණකය දී ඇති විට එම සංඛ්‍යාව සෙවීම

සංඛ්‍යාවක ලඝුගණකය දී ඇති විට එම සංඛ්‍යාව ලබා ගැනීම ''ප්‍රතිලඝුගණකය'' සෙවීම ලෙස හැඳින්වෙයි.

$lg\ 1.39 = 0.1430$ නිසා
0.1430 ප්‍රතිලඝුගණකය $= 1.39$
එය antilog $0.1430 = 1.39$ ලෙස ලියනු ලැබේ.

**නිදසුන (3)**

1.5514 ප්‍රතිලඝුගණකය සොයමු. මෙම ලඝුගණකයේ දශමාංශය එනම් 5514 ලඝුගණක වගුවේ 35 සඳහන් පේළියේ 6 සඳහන් තීරය හමුවන තැන ඇති නිසා සංඛ්‍යාවේ ඉලක්කම් 356 විය යුතු ය. ලඝුගණකයේ පූර්ණාංශය 1 නිසා ප්‍රතිලඝුගණකයේ පූර්ණාංශයේ ඉලක්කම් 2 ක් තිබිය යුතු ය.


$\therefore$ antilog $1.5514 = 35.6$
antilog $2.5514 = 356$ වේ.

**නිදසුන (4)**

0.4804 හි ප්‍රතිලඝුගණකය සොයමු. මෙහි දශමාංශය, ලඝුගණක වගුවේ හරියට ම සටහන් වී නැත. එවිට 4804ට පූර්වාසන්න ලඝුගණකයට මධ්‍යන්‍ය අන්තර තීරයේ අගයක් එකතු වී මෙම ලඝුගණකයේ දශමාංශය සෑදී ඇතැයි සැලකේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඒ අනුව 4800 + 4 = 4804 නිසා මෙම ලඝුගණකය ඇතුළත් වන්නේ 30 පේළියේ 2 සඳහන් තීරය හමු වන තැන සහ මධ්‍යන්‍ය අන්තරවල 3 වන තීරය හමුවන අගය එකතු වීමෙන් ලෙස සලකා ප්‍රතිලඝුගණකයේ ඉලක්කම් සටහන් කරනු ලැබේ.





ඒ අනුව සංඛ්‍යාවේ ඉලක්කම 3023 විය යුතු ය. ලඝුගණකයේ පූර්ණාංශය 0 නිසා ප්‍රතිලඝුගණකයේ ඉලක්කම් එකක් වෙන් ව තිබිය යුතු ය.

$\therefore$ antilog 0.4804 = 3.023

**නිදසුන (5)** 2.1715 ප්‍රතිලඝුගණකය සොයමු.

1715 දශමාංශය 1703 + 12 ලෙස සකස් වී ඇතැයි සැලකූ විට




ප්‍රතිලඝුගණකයේ ඉලක්කම 1484 විය යුතු ය. ලඝුගණකයේ පූර්ණාංශය 2 නිසා ප්‍රතිලඝුගණකයේ පූර්ණාංශයේ ඉලක්කම් 3ක් වෙන්ව තිබිය යුතු ය.

$\therefore$ antilog 2.1715 = 148.4

**20-5 අභ්‍යාසය**

(1) පහත සඳහන් එක් එක් ලඝුගණකයේ ප්‍රතිලඝුගණකය සොයන්න.

(i) 0.6138 (ii) 2.8476 (iii) 1.4087 (iv) 3.5819
(v) 2.7471 (vi) 3.0958 (vii) 4.7787 (viii) 1.2728

## 20-5 ලඝුගණක භාවිතයෙන් සංඛ්‍යා ගුණකිරීම

යම් පාදයක ගුණිතයක ලඝුගණකය එම පාදයේ වෙන වෙන ම ලඝු ගණකයන්ගේ එකතුවක් ලෙස ප්‍රකාශ කළ හැකි බව කලින් ඒකකයේ උගත්තෙමු. එය $log_a MN = \log_a M + \log_a N$ ලෙස දැක්විය හැක.

**නිදසුන (6)** 5.5 x 3.2 හි අගය ලඝුගණක වගුව ඇසුරින් සොයන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

$\log(5.5 \times 3.2) = \lg 5.5 + \lg 3.2$ (ලඝු නීතිය අනුව)

$= 0.7404 + 0.5051$

$\lg(5.5 \times 3.2) = 1.2455$

$5.5 \times 3.2 = \text{antilog } 1.2455$

$= \underline{\underline{17.6}}$

**නිදසුන (7)** 17.24 x 5.4 x 7.651 හි අගය ලඝුගණක වගුව ඇසුරින් සොයන්න.

$\lg(17.24 \times 5.4 \times 7.651) = \lg 17.24 + \lg 5.4 + \lg 7.651$

$= 1.2365 + 0.7324 + 0.8838$

$= 2.8527$

$17.24 \times 5.4 \times 7.651 = \text{antilog } 2.8527$

$= \underline{\underline{712.3}}$

## 20-6 ලඝුගණක භාවිතයෙන් සංඛ්‍යා බෙදීම

මෙහි දී භාවිතාවන ලක්ෂණය කලින් ඒකකයේ දී මෙසේ යොදා ගන්නා ලදි.

$$\log_a\left(\frac{M}{N}\right) = \log_a M - \log_a N$$

**නිදසුන (8)** 8.789 ÷ 5.42 අගය ලඝුගණක වගුව ඇසුරින් සොයන්න.

$\lg(8.789 \div 5.42) = \lg 8.789 - \lg 5.42$

$= 0.9439 - 0.7340$

$= 0.2099$

$8.789 \div 5.42 = \text{antilog } 0.2099$

$= \underline{\underline{1.621}}$

**නිදසුන (9)** $\frac{29.3 \times 6.285}{12.34}$ හි අගය ලඝුගණක වගුව ඇසුරින් ලබාගන්න.

$$\lg\left(\frac{29.3 \times 6.285}{12.34}\right) = \lg(29.3 \times 6.285) - \lg 12.34$$

$= (\lg 29.3 + \lg 6.285) - \lg 12.34$

$= 1.4669 + 0.7983 - 1.0913$

$= 2.2652 - 1.0913$

$= 1.1739$

$$\frac{29.3 \times 6.285}{12.34} = \text{antilog } 1.1739 = 14.92$$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

20-6 අභ්‍යාසය

ලඝුවක්‍ර භාවිතකර සුළු කරන්න. ලැබුණු පිළිතුරුවල සත්‍යතාවය ගණකය භාවිතයෙන් පරීක්ෂා කරන්න. (ගණනය කිරීම සඳහා ගණකය භාවිතයට ඉඩදෙනු නොලැබේ.)

(i) 358.7 x 1.96

(ii) 64.52 x 90.02

(iii) 584.5 ÷ 11.3

(iv) 4861 ÷ 9.254

(v) 8.02 x 47.65 x 65

(vi) $\dfrac{14.71 \times 28.2}{81.56}$

(vii) $\dfrac{4.687 \times 249}{69.53}$

(viii) $\dfrac{952.4}{3.85 \times 43.01}$

(ix) $\dfrac{9.864 \times 700.7}{33.41 \times 6.73}$

(x) $\dfrac{9.72 \times 96.87 \times 105.4}{852.3}$

(xi) $\dfrac{3.98 \times 52.4 \times 80.52}{1.6 \times 13.51 \times 12.4}$

(xii) (4.807 x 35.7) + (24.83 ÷ 8.57)

**සාරාංශය**

- 1ත් 10ත් අතර සංඛ්‍යාවක ලඝුගණකය ලඝුගණක වගු භාවිතයෙන් සෙවිය හැකි ය.
- සංඛ්‍යාවක 10 පාදයට ලඝුගණකය කෙටියෙන් *lg* ලෙස ලියනු ලැබේ.
- ඉලක්කම් හතරක සංඛ්‍යාවක ලඝුගණකය සෙවීමේ දී හතරවන ඉලක්කම සඳහා වගුවේ මධ්‍යන්‍ය අන්තර තීරය භාවිත කළ යුතු ය.
- සංඛ්‍යාවක ලඝුගණකය දී ඇති විට ඊට අනුරූප සංඛ්‍යාව ප්‍රති ලඝුගණකය (antilog) ලෙස හැඳින්වෙයි.
- සංඛ්‍යා ගුණ කිරීම හා බෙදීම පහසුවෙන් කිරීමට ලඝුගණක වගු භාවිත කළ හැකි ය.

## මිශ්‍ර අභ්‍යාසය

(1) $lg\ 6.143 = 0.7884$ යන්න භාවිතයෙන් මේ එක එකෙහි ලඝුගණකයන් සොයන්න.

(i) 614.3 (ii) 6143 (iii) 61430

(2) $antilog\ 1.2263 = 16.84$ යන්න භාවිතයෙන් මේවායේ අගය සොයන්න.

(i) $antilog\ 0.2263$ (ii) $antilog\ 3.2263$

(iii) $antilog\ 2.2263$ (iv) $antilog\ 4.2263$

(3) $lg\ 5 = 0.6990$ භාවිතයෙන් $lg\ 2$ අගය සොයන්න.

(4) $lg\ 7 = 0.8451$ භාවිතයෙන් $lg\left(1\frac{3}{7}\right)$ අගය සොයන්න.

(5) $lg\ 2 = 0.3010$, $lg\ 3 = 0.4771$ භාවිතයෙන් $lg\ 6$ හි අගය සොයන්න.

(6) අරය $r$ වූ වෘත්තයක පරිධිය $2\pi r$ නම් අරය 1.85m ක් වූ වෘත්තාකාර පාත්තියක පරිධිය සොයන්න.

(7) (i) $\frac{48.92 \times 1.97}{6.95}$ හි දළ අගය නිමානය කරන්න.

(ii) ලඝුගණක වගුව භාවිතයෙන් අගය සොයා පිළිතුර, කලින් නිමානය කළ අගය සමග සසඳන්න.

(8) ලඝුගණක වගුව භාවිතයෙන් අගය සොයන්න.

(i) $\frac{35.79}{4.36} \times \frac{11.64}{5.77}$ (ii) $\frac{456.3 \times 760}{875.5 \times 38}$

(iii) $\frac{125 \times 10.5}{5.85 \times 35}$ (iv) $\frac{2450 \times 32}{45 \times 8 \times 3}$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# ලඝුගණක   மடக்கைகள்   LOGARITHMS

| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | Mean Differences 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | 0000 | 0043 | 0086 | 0128 | 0170 | 0212 | 0253 | 0294 | 0334 | 0374 | 4 | 8 | 12 | 17 | 21 | 25 | 29 | 33 | 37 |
| 11 | 0414 | 0453 | 0492 | 0531 | 0569 | 0607 | 0645 | 0682 | 0719 | 0755 | 4 | 8 | 11 | 15 | 19 | 23 | 26 | 30 | 34 |
| 12 | 0792 | 0828 | 0864 | 0899 | 0934 | 0969 | 1004 | 1038 | 1072 | 1106 | 3 | 7 | 10 | 14 | 17 | 21 | 24 | 28 | 31 |
| 13 | 1139 | 1173 | 1206 | 1239 | 1271 | 1303 | 1335 | 1367 | 1399 | 1430 | 3 | 6 | 10 | 13 | 16 | 19 | 23 | 26 | 29 |
| 14 | 1461 | 1492 | 1523 | 1553 | 1584 | 1614 | 1644 | 1673 | 1703 | 1732 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 |
| 15 | 1761 | 1790 | 1818 | 1847 | 1875 | 1903 | 1931 | 1959 | 1987 | 2014 | 3 | 6 | 8 | 11 | 14 | 17 | 20 | 22 | 25 |
| 16 | 2041 | 2068 | 2095 | 2122 | 2148 | 2175 | 2201 | 2227 | 2253 | 2279 | 3 | 5 | 8 | 11 | 13 | 16 | 18 | 21 | 24 |
| 17 | 2304 | 2330 | 2355 | 2380 | 2405 | 2430 | 2455 | 2480 | 2504 | 2529 | 2 | 5 | 7 | 10 | 12 | 15 | 17 | 20 | 22 |
| 18 | 2553 | 2577 | 2601 | 2625 | 2648 | 2672 | 2695 | 2718 | 2742 | 2765 | 2 | 5 | 7 | 9 | 12 | 14 | 16 | 19 | 21 |
| 19 | 2788 | 2810 | 2833 | 2856 | 2878 | 2900 | 2923 | 2945 | 2967 | 2989 | 2 | 4 | 7 | 9 | 11 | 13 | 16 | 18 | 20 |
| 20 | 3010 | 3032 | 3054 | 3075 | 3096 | 3118 | 3139 | 3160 | 3181 | 3201 | 2 | 4 | 6 | 8 | 11 | 13 | 15 | 17 | 19 |
| 21 | 3222 | 3243 | 3263 | 3284 | 3304 | 3324 | 3345 | 3365 | 3385 | 3404 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 |
| 22 | 3424 | 3444 | 3464 | 3483 | 3502 | 3522 | 3541 | 3560 | 3579 | 3598 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 15 | 17 |
| 23 | 3617 | 3636 | 3655 | 3674 | 3692 | 3711 | 3729 | 3747 | 3766 | 3784 | 2 | 4 | 6 | 7 | 9 | 11 | 13 | 15 | 17 |
| 24 | 3802 | 3820 | 3838 | 3856 | 3874 | 3892 | 3909 | 3927 | 3945 | 3962 | 2 | 4 | 5 | 7 | 9 | 11 | 12 | 14 | 16 |
| 25 | 3979 | 3997 | 4014 | 4031 | 4048 | 4065 | 4082 | 4099 | 4116 | 4133 | 2 | 3 | 5 | 7 | 9 | 10 | 12 | 14 | 15 |
| 26 | 4150 | 4166 | 4183 | 4200 | 4216 | 4232 | 4249 | 4265 | 4281 | 4298 | 2 | 3 | 5 | 7 | 8 | 10 | 11 | 13 | 15 |
| 27 | 4314 | 4330 | 4346 | 4362 | 4378 | 4393 | 4409 | 4425 | 4440 | 4456 | 2 | 3 | 5 | 6 | 8 | 9 | 11 | 13 | 14 |
| 28 | 4472 | 4487 | 4502 | 4518 | 4533 | 4548 | 4564 | 4579 | 4594 | 4609 | 2 | 3 | 5 | 6 | 8 | 9 | 11 | 12 | 14 |
| 29 | 4624 | 4639 | 4654 | 4669 | 4683 | 4698 | 4713 | 4728 | 4742 | 4757 | 1 | 3 | 4 | 6 | 7 | 9 | 10 | 12 | 13 |
| 30 | 4771 | 4786 | 4800 | 4814 | 4829 | 4843 | 4857 | 4871 | 4886 | 4900 | 1 | 3 | 4 | 6 | 7 | 9 | 10 | 11 | 13 |
| 31 | 4914 | 4928 | 4942 | 4955 | 4969 | 4983 | 4997 | 5011 | 5024 | 5038 | 1 | 3 | 4 | 6 | 7 | 8 | 10 | 11 | 12 |
| 32 | 5051 | 5065 | 5079 | 5092 | 5105 | 5119 | 5132 | 5145 | 5159 | 5172 | 1 | 3 | 4 | 5 | 7 | 8 | 9 | 11 | 12 |
| 33 | 5185 | 5198 | 5211 | 5224 | 5237 | 5250 | 5263 | 5276 | 5289 | 5302 | 1 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 | 12 |
| 34 | 5315 | 5328 | 5340 | 5353 | 5366 | 5378 | 5391 | 5403 | 5416 | 5428 | 1 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 | 11 |
| 35 | 5441 | 5453 | 5465 | 5478 | 5490 | 5502 | 5514 | 5527 | 5539 | 5551 | 1 | 2 | 4 | 5 | 6 | 7 | 9 | 10 | 11 |
| 36 | 5563 | 5575 | 5587 | 5599 | 5611 | 5623 | 5635 | 5647 | 5658 | 5670 | 1 | 2 | 4 | 5 | 6 | 7 | 8 | 10 | 11 |
| 37 | 5682 | 5694 | 5705 | 5717 | 5729 | 5740 | 5752 | 5763 | 5775 | 5786 | 1 | 2 | 3 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 38 | 5798 | 5809 | 5821 | 5832 | 5843 | 5855 | 5866 | 5877 | 5888 | 5899 | 1 | 1 | 3 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 39 | 5911 | 5922 | 5933 | 5944 | 5955 | 5966 | 5977 | 5988 | 5999 | 6010 | 1 | 2 | 3 | 4 | 5 | 7 | 8 | 9 | 10 |
| 40 | 6021 | 6031 | 6042 | 6053 | 6064 | 6075 | 6085 | 6096 | 6107 | 6117 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 |
| 41 | 6128 | 6138 | 6149 | 6160 | 6170 | 6180 | 6191 | 6201 | 6212 | 6222 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 42 | 6232 | 6243 | 6253 | 6263 | 6274 | 6284 | 6294 | 6304 | 6314 | 6325 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 43 | 6335 | 6345 | 6355 | 6365 | 6375 | 6385 | 6395 | 6405 | 6415 | 6425 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 44 | 6435 | 6444 | 6454 | 6464 | 6474 | 6484 | 6493 | 6503 | 6513 | 6522 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 45 | 6532 | 6542 | 6551 | 6561 | 6571 | 6580 | 6590 | 6599 | 6609 | 6618 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 46 | 6628 | 6637 | 6646 | 6656 | 6665 | 6675 | 6684 | 6693 | 6702 | 6712 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 7 | 8 |
| 47 | 6721 | 6730 | 6739 | 6749 | 6758 | 6767 | 6776 | 6785 | 6794 | 6803 | 1 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 | 8 |
| 48 | 6812 | 6821 | 6830 | 6839 | 6848 | 6857 | 6866 | 6875 | 6884 | 6893 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 | 8 |
| 49 | 6902 | 6911 | 6920 | 6928 | 6937 | 6946 | 6955 | 6964 | 6972 | 6981 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 | 8 |
| 50 | 6990 | 6998 | 7007 | 7016 | 7024 | 7033 | 7042 | 7050 | 7059 | 7067 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 51 | 7076 | 7084 | 7093 | 7101 | 7110 | 7118 | 7126 | 7135 | 7143 | 7152 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 52 | 7160 | 7168 | 7177 | 7185 | 7193 | 7202 | 7210 | 7218 | 7226 | 7235 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 7 |
| 53 | 7243 | 7251 | 7259 | 7267 | 7275 | 7384 | 7292 | 7300 | 7308 | 7316 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 6 | 7 |
| 54 | 7324 | 7332 | 7340 | 7348 | 7356 | 7364 | 7372 | 7380 | 7388 | 7396 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 6 | 7 |
| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

## ලඝුගණක　　மடக்கைகள்　　LOGARITHMS

| | | | | | | | | | | | இடை வித்தியாசங்கள் Mean Differences | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 55 | 7404 | 7412 | 7419 | 7427 | 7435 | 7443 | 7451 | 7459 | 7466 | 7474 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 56 | 7482 | 7490 | 7497 | 7505 | 7513 | 7520 | 7528 | 7536 | 7543 | 7551 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 57 | 7559 | 7566 | 7574 | 7582 | 7589 | 7597 | 7604 | 7612 | 7619 | 7627 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 58 | 7634 | 7642 | 7649 | 7657 | 7664 | 7672 | 7679 | 7686 | 7694 | 7701 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 |
| 59 | 7709 | 7716 | 7723 | 7731 | 7738 | 7745 | 7752 | 7760 | 7767 | 7774 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 |
| 60 | 7782 | 7789 | 7796 | 7803 | 7810 | 7818 | 7825 | 7832 | 7839 | 7846 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 6 |
| 61 | 7853 | 7860 | 7868 | 7875 | 7882 | 7889 | 7896 | 7903 | 7910 | 7917 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 6 |
| 62 | 7924 | 7931 | 7938 | 7945 | 7952 | 7959 | 7966 | 7973 | 7980 | 7987 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 6 |
| 63 | 7993 | 8000 | 8007 | 8014 | 8021 | 8028 | 8035 | 8041 | 8048 | 8055 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 64 | 8062 | 8069 | 8075 | 8082 | 8089 | 8096 | 8102 | 8109 | 8116 | 8122 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 65 | 8129 | 8136 | 8142 | 8149 | 8156 | 8162 | 8169 | 8176 | 8182 | 8189 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 66 | 8195 | 8202 | 8209 | 8215 | 8222 | 8228 | 8235 | 8241 | 8248 | 8254 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 67 | 8261 | 8267 | 8274 | 8280 | 8287 | 8293 | 8299 | 8306 | 8312 | 8319 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 68 | 8325 | 8331 | 8338 | 8344 | 8351 | 8357 | 8363 | 8370 | 8376 | 8382 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 4 | 5 | 6 |
| 69 | 8388 | 8395 | 8401 | 8407 | 8414 | 8420 | 8426 | 8432 | 8439 | 8455 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 6 |
| 70 | 8451 | 8457 | 8463 | 8470 | 8476 | 8482 | 8488 | 8494 | 8500 | 8506 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 6 |
| 71 | 8513 | 8519 | 8525 | 8531 | 8537 | 8543 | 8549 | 8555 | 8561 | 8567 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 5 |
| 72 | 8573 | 8579 | 8585 | 8591 | 8597 | 8603 | 8609 | 8615 | 8621 | 8627 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 5 |
| 73 | 8633 | 8639 | 8645 | 8651 | 8657 | 8663 | 8669 | 8675 | 8681 | 8686 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 5 |
| 74 | 8692 | 8698 | 8704 | 8710 | 8716 | 8722 | 8727 | 8733 | 8739 | 8745 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 5 |
| 75 | 8751 | 8756 | 8762 | 8768 | 8774 | 8779 | 8785 | 8791 | 8797 | 8802 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 5 | 5 |
| 76 | 8808 | 8814 | 8820 | 8825 | 8831 | 8837 | 8842 | 8848 | 8854 | 8859 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 5 | 5 |
| 77 | 8865 | 8871 | 8876 | 8882 | 8887 | 8893 | 8899 | 8904 | 8910 | 8915 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 78 | 8921 | 8927 | 8932 | 8938 | 8943 | 8949 | 8954 | 8960 | 8965 | 8971 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 79 | 8976 | 8982 | 8987 | 8993 | 8998 | 9004 | 9009 | 9015 | 9020 | 9025 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 80 | 9031 | 9036 | 9042 | 9047 | 9053 | 9058 | 9063 | 9069 | 9074 | 9079 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 81 | 9085 | 9090 | 9096 | 9101 | 9106 | 9112 | 9117 | 9122 | 9128 | 9133 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 82 | 9138 | 9143 | 9149 | 9154 | 9159 | 9165 | 9170 | 9175 | 9180 | 9186 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 83 | 9191 | 9196 | 9201 | 9206 | 9212 | 9217 | 9222 | 9227 | 9232 | 9238 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 84 | 9243 | 9248 | 9253 | 9258 | 9263 | 9269 | 9274 | 9279 | 9284 | 9289 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 85 | 9294 | 9299 | 9304 | 9309 | 9315 | 9320 | 9325 | 9330 | 9335 | 9340 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 86 | 9345 | 9350 | 9355 | 9360 | 9365 | 9370 | 9375 | 9380 | 9385 | 9390 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 | 5 |
| 87 | 9395 | 9400 | 9405 | 9410 | 9415 | 9420 | 9425 | 9430 | 9435 | 9440 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 88 | 9445 | 9450 | 9455 | 9460 | 9465 | 9469 | 9474 | 9479 | 9484 | 9489 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 89 | 9494 | 9499 | 9504 | 9509 | 9513 | 9518 | 9523 | 9528 | 9533 | 9538 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 90 | 9542 | 9547 | 9552 | 9557 | 9562 | 9566 | 9571 | 9576 | 9581 | 9586 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 91 | 9590 | 9595 | 9600 | 9605 | 9609 | 9614 | 9619 | 9624 | 9628 | 9633 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 92 | 9638 | 9643 | 9647 | 9652 | 9657 | 9661 | 9666 | 9671 | 9675 | 9680 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 93 | 9685 | 9689 | 9694 | 9699 | 9703 | 9708 | 9713 | 9717 | 9722 | 9727 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 94 | 9731 | 9736 | 9741 | 9745 | 9750 | 9754 | 9759 | 9763 | 9768 | 9773 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 95 | 9777 | 9782 | 9786 | 9791 | 9795 | 9800 | 9805 | 9809 | 9814 | 9818 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 96 | 9823 | 9827 | 9832 | 9836 | 9841 | 9845 | 9850 | 9854 | 9859 | 9863 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 97 | 9868 | 9872 | 9877 | 9881 | 9886 | 9890 | 9894 | 9899 | 9903 | 9908 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 98 | 9912 | 9917 | 9921 | 9926 | 9930 | 9934 | 9939 | 9943 | 9948 | 9952 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 4 | 4 |
| 99 | 9956 | 9961 | 9965 | 9969 | 9974 | 9978 | 9983 | 9987 | 9991 | 9996 | 0 | 1 | 1 | 2 | 2 | 3 | 3 | 3 | 4 |
| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.